| උසස් පෙළින් සරසවියට | | | | |
|---|---|---|---|---|
| මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | | | | |
| උසස් පෙළ ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2025 | | | | |
| බෞද්ධ ශිෂ්ටාචාරය - I | 12 ශ්‍රේණිය | 45 | S | I | කාලය පැය 02 යි. |

<u>වැදගත්</u>

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට 1,2,3,4,5 යන පිළිතුරු වලින් වඩාත් ගැලපෙන පිළිතුර තෝරා එය සලකුණු කරන්න.

1. මහා බ්‍රහ්මයා විසින් මිනිසුන්ගේ ගුණකර්ම භේදය සලකාගෙන සමාජයේ සිටින සියලු මිනිසුන් ප්‍රධාන කොටස් හතරකට බෙදා මවන ලද දැක්වෙන බ්‍රාහ්මණය ඉගැන්වීම වනුයේ?
   i. ස්වධර්ම
   ii. වර්ණ ධර්ම
   iii. ආශ්‍රම ධර්ම
   iv. ආපද් ධර්ම
   v. නියාම ධර්ම

2. බ්‍රාහ්මණ ඉගැන්වීම අනුව සන්‍යාසි ආශ්‍රමයේදී සිදු කළ යුතු ප්‍රධානතම කාර්යය ලෙස හැඳින්විය හැක්කේ බ්‍රහ්ම සහව්‍යතාවය අපේක්ෂාවෙන්,
   i. වනගතව විසීමයි
   ii. ස්තෝත්‍ර ගායනා කිරීමයි
   iii. වේද අධ්‍යයනය කිරීමයි
   iv. වතාවත් කිරීමයි
   v. අනගාරිකව සංචාරක දිවියක් ගත කිරීමයි.

3. බ්‍රාහ්මණ සංස්කෘතියේ ප්‍රමුඛ ආගමික සංස්කාර විදියක් වූ යාග කර්මයේ වේද පාඨ ගායනා කරන්නා හඳුන්වා ඇත්තේ කවර නමකින්ද?
   i. හෝතෘ
   ii. අධ්වර්යු
   iii. උද්ගාතෘ
   iv. යඥකාරක
   v. යඥග්‍රාහක

4. ස්වාමියා මලපසු භාර්යාව ජීවත් වන්නේ නම් ඇය වාසය කළ යුත්තේ කිලිටි වස්ත්‍ර හැඳ රසවත් ආහාරපානාදියෙන් වැළකී කිසිදු ආභරණයක් නොපැළඳ මියගිය සැමියාම පතමින් ගෘහ දාසියක වශයෙනි. මෙම චාරිත්‍රය බ්‍රාහ්මණ ධර්මයන්හි දැක්වෙන්නේ,
   i. පර්ධා චාරිත්‍රය වශයෙනි.
   ii. ගෘහීය චාරිත්‍රය වශයෙනි
   iii. උපනයන චාරිත්‍රය වශයෙනි
   iv. ශ්‍රද්ධ පූජාව වශයෙනි
   v. සති පූජාව වශයෙනි

5. මහා බ්‍රහ්මයා විසින් චතුර් වර්ණය නිර්මාණය කර ඒ ඒ වර්ණයට නියමිත කාර්යයන් පැවරීමක් කරන ලදී. මෙහිදීම වෛශයන්ට සුවිශේෂී වූ කාර්ය ගණනාවක් නිර්දේශ කළ බව දැක ගත හැකි විය. ඒවායින් කිහිපයක් නම්,
   i. දන්දීම, ඉගෙනීම හා ප්‍රභූන්ට මෙහෙවර කිරීම
   ii. රට පාලනය කිරීම, දන්දීම හා වෙළඳාම් කිරීම
   iii. දන්දීම, යාග කිරීම හා සත්ත්ව පාලනය
   iv. යාග කරවීම, දන් පිළිගැනීම හා යාග කිරීම
   v. ඉගැන්වීම, යාග කිරීම හා සත්ත්ව පාලනය

6. දානයෙන් ඉන්ද්‍රිය දමනයෙන් සංවරයෙන් හා සත්‍ය වචනයෙන් සිදුවන පිනක් නැත. යනුවෙන් අකිරියවාදයක් ඉගැන්වූ බුද්ධ කාලීන ශාස්තෘවරයා වන්නේ,

    i. නිගණ්ඨනාථපුත්ත
    ii. අජිත කේශකම්බල ය
    iii. සංජය බෙල්ලට්ඨපුත්ත ය
    iv. පූර්ණ කස්සපය
    v. පකුධකච්චායනය

7. තමන් කෙලෙස් ගැටවලින් තොර යැයි කියා සිටි සාධුවරුන්.......................නම් වූ අතර ශ්වේතාම්බර හා දිගම්බර යනුවෙන් දෙයාකාර වූ ඔවුන් දුෂ්කර ව්‍රත අනුගමනය කළ පිරිසකි.

    i. ආජීවක
    ii. පරිබ්‍රාජක
    iii. ජටිල
    iv. නිගණ්ඨ
    v. තීර්ථක

8. පහත සඳහන් ප්‍රකාශ කියවා බුද්ධකාලීන භාරතීය ශ්‍රමණ සම්ප්‍රදායේ අනන්‍යතා ලක්ෂණ පමණක් ඇතුළත් වරණය තෝරන්න.

A. නිදහස් චින්තනය අගය කිරීම
B. අනගාරික ප්‍රතිපදාව පිළිගැනීම
C. පුද්ගල උපත පදනම් කරගත් සමාජ වර්ගීකරණයේ බැහැර කිරීම
D. ඥාන මාර්ගය ප්‍රතික්ෂේප කිරීම
E. බ්‍රහ්ම චරියාව උසස් ප්‍රතිපදාවක් ලෙස සැලකීම

    i. A B C D
    ii. A B C E
    iii. A C D E
    iv. B C D E
    v. A B C D E

9. බුදුරජාණන් වහන්සේ පිරිමි පාර්ශ්වයට මෙන්ම කාන්තා පාර්ශ්වයට ද සමාන අයිතිවාසිකම් ලබාදීමට ක්‍රියාකළ සේක. ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව ශාසනික ප්‍රතිලාභ උරුමකර දීම තුළින් ඒ බව පැහැදිලි වේ. භික්ෂුණී හා උපාසිකා පිරිස් සඳහාද තනතුරු පවා ප්‍රදානය කළ සේක. ඒ අතරින් දිවැස් ඇති භික්ෂුණීන් අතර අග්‍රස්ථානය හා බහුශ්‍රැත උපාසිකාවන් අතර අග්‍රස්ථානය හිමි වූයේ,

    i. මහා ප්‍රජාපති ගෝතමී තෙරණියට හා විශාකා උපාසිකාවටය
    ii. පටාචාරා තෙරණිය හා සුජාතා උපාසිකාවටය
    iii. සකුලා තෙරණිය හා ඛුජ්ජුත්තරා උපාසිකාවටය
    iv. උත්පලවණ්ණා තෙරණිය හා සාමාවතී උපාසිකාවටය
    v. ඛේමා තෙරණියට හා ඛුජ්ජුත්තරා උපාසිකාවටය

10. ක්‍රිස්තු පූර්ව හයවන සියවසේ භාරත දේශයේ නගර නිර්මාණයට හා නාගරීකරණයට බලපෑ ප්‍රමුඛතම සාධකය ලෙස සැලකිය හැක්කේ,

    i. යුද ගැටුම් ඉහළ යාමයි
    ii. සිටුවර පන්තියක් බිහිවීමයි
    iii. කෘෂි නිෂ්පාදන වර්ධනය වීමයි
    iv. ජනගහනය වැඩිවීමයි
    v. ජනතාව සුඛෝපභෝගීත්වයට නැඹුරු වීමයි

11. බුද්ධ කාලීන භාරතයේ පැවති සොළොස්මහා ජනපද අතුරින් විශාලතම නියෝජිත මන්ත්‍රී මණ්ඩලයකින් පාලනය කරන ලද වූ ජනපදය ලෙස සැලකෙන්නේ,

| | | | |
|---|---|---|---|
| i. | මගධ ජනපදයයි | iv. | මල්ල ජනපදයයි |
| ii. | කොසොල් ජනපදයයි | v. | කුරු ජනපදයයි |
| iii. | වජ්ජි ජනපදයයි | | |

12. කෘෂි ආර්ථිකයකට මුල් තැනක් පැරණි භාරතයේ ජාත්‍යන්තර වශයෙන් වාණිජකරණය දියුණු තත්ත්වයකට පත්ව තිබුණු බවට දැක්විය හැකි වඩාත්ම සුදුසු සාධකය වනුයේ,

i. සේද මාර්ගය ඔස්සේ සිදුවූ වෙළඳාමයි
ii. නව නගර නිර්මාණය වීමයි
iii. භාණ්ඩ නිෂ්පාදනය ඉහළ යාමයි
iv. කෘෂි නිෂ්පාදනවලින් ස්වයංපෝෂිත වීමයි
v. ගංගාවන් ඔස්සේ භාණ්ඩ ප්‍රවාහනයයි

13. භාරතීය නාගරීකරණය සමඟ මහනගර ලෙස නිර්මාණය වූ නගරයක් නොවන්නේ

| | | | |
|---|---|---|---|
| i. | රාජගහ | iv. | කෝසම්බි |
| ii. | සාකේත | v. | බාරාණසි |
| iii. | ලුම්බිණි | | |

14. බුද්ධකාලීන භාරතීය රාජ්‍ය පාලකයන් හා බුදුන් වහන්සේ අතර සමීප සම්බන්ධතා පැවැති බව ඓතිහාසික මූලාශ්‍ර පැහැදිලි කරයි. ඔවුන් අතරින් පසේනදී කොසොල් රජුට ප්‍රමුඛස්ථානය හිමිවෙයි. ඒ බව වඩාත් හොඳින් තහවුරු කරන සිදුවීම කුමක්ද ?

i. වේළුවනාරාමය පූජා කිරීම
ii. කොසොල් රාජ්‍යයේ වැඩිම වසර ගණක් වස් විසීම
iii. රාජ භටයින් පැවිදි නොකරන ලෙස ඉල්ලීම
iv. උපෝසථ කර්මයා අනුදැන වදාරන ලෙස ඉල්ලීම
v. තිරෝකුඩ්ඩ සූත්‍රය දේශනා කිරීම

15. බුද්ධකාලයේ පැවැති මහා රාජ්‍යයන් සෑම එකකම පාහේ බුදු දහමේ ව්‍යාප්තිය සිදු වූ බවට සාක්ෂි ත්‍රිපිටක සාහිත්‍යයේ සඳහන් ඇතැම් විවරණයන් තුළිනුත් පුරාවිද්‍යා ගවේෂණ තුළිනුත් අනාවරණය කරගෙන ඇත. ඒ අනුව බුදුරදුන් වෙනුවෙන් එකළ ඉදි වූ ප්‍රබල ආරාම දෙකක් වූ ........................... පිහිටා තිබුනේ කෝසලය හා වත්ස යන ජනපදයන්හිය.

i. ජේතවනාරාමය හා පූර්වාරාමය
ii. ජේතවනාරාමය හා වේළුවනාරාමය
iii. පූර්වාරාමය හා සෝෂිතාරාමය
iv. වේළුවනාරාමය හා රාජකාරාමය
v. නිග්‍රෝධාරාමය හා වේළුවනාරාමය

16. පටාචාරා, කිසාගෝතමී, සුමනා යන අය මෙන් ම ජානුස්සෝනි, අස්සලායන සංගාරව ආදී වශයෙන් සඳහන් බ්‍රාහ්මණ ගෘහපතීන් ද පැවිද්ද ලැබුවේ බුදුරදුන් කිනම් රාජ්‍යයේ වැඩ වසන වකවානුවේද?

i. මගධ රාජ්‍යයේ වැඩ වසන වකවානුවේය.

ii. කෝසල රාජ්‍යයේ වැඩ වසන වකවානුවේය.

iii. වත්ස රාජ්‍යයේ වැඩ වසන වකවානුවේය.

iv. වජ්ජි රාජ්‍යයේ වැඩවසන වකවානුවේය.

v. අවන්ති රාජ්‍යයේ වැඩ වසන වකවානුවේය.

17. පහත දැක්වෙනුයේ සොළොස් මහා ජනපදවලට අදාළ කිසියම් තොරතුරු කිහිපයකි.

A. දම්සක් පැවැතුම් සූත්‍රය

B. කූටාගාර ශාලාව

C. පස්වෙනි වස්කාලය

D. මහා කච්චායනා හිමි

E. භික්ෂුණී ශාසනය පිහිටුවීම

මෙයින් වජ්ජී රාජ්‍යයට අදාළව තොරතුරු දැක්වෙන්නේ

i. BCE වලය

ii. CDE වලය

iii. ABC වලය

iv. ACD වලය

v. ADE වලය

18. ක්‍රි. පූ. හයවන සියවසේ විවිධ ආර්මික රටාවන් හා විවිධ ජීවන වෘත්තීන් පැවැති බවට තොරතුරු මූලාශ්‍ර මගින් හමු වේ. ගැල් ප්‍රවාහනයෙන් කළ වෙළදාම් ද භාරුකච්ඡ වැනි වරායන් ඔස්සේ කළ නාවික වෙළදාම ද ඒ ඒ වාණිජ නගර යා කරමින් පැවැති ප්‍රධාන වෙළඳ මාර්ග ද ක්‍රියාත්මක වීමෙන් ප්‍රකට වන්නේ,

i. බුද්ධකාලීන භාරතයේ රැකියා අවස්ථා බහුල වූ බවයි.

ii. බුද්ධකාලීන භාරතය වාණිජකරණයට හා නාගරීකරණයට පත් වී තිබූ බවයි.

iii. දියුණු මාර්ග පද්ධතියක් පැවැති බවයි.

iv. මනා ප්‍රවාහන පද්ධතියක් පැවැති බවයි

v. නාවික මාර්ග වෙළඳාමට උපකාරී වූ බවයි..

19. වෙළඳාමේදී නොකළ යුතු වංචනික ක්‍රම ගණනාවක් දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රය තුළින් බුදුරදුන් පෙන්වා දී ඇත. එම සූත්‍රයේ ඇතුළත් නොවන කරුණක් වන්නේ,

i. තුලාකූට

ii. මානකූට

iii. නිප්පේසිකතා

iv. උක්කෝටන

v. විපරාමෝස

20. ගෘහස්ථ ජීවිතය තුළ සදාචාරාත්මක සීමාව ඉක්මවා කම් සැප නොවිඳිය යුතු බව උගන්වන ශික්ෂා පදය වන්නේ,

i. ''සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි'' යනුවෙනි.

ii. ''අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛා පදං සමාදියාමි'' යනුවෙනි.

iii. ''අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි'' යනුවෙනි.

iv. ''කාමේසු මිච්ඡා චරියා වේරමණී සික්ඛාපදං සමාදියාමි'' යනුවෙනි.

v. ''පිසුනාවාචා වේරමණී සික්ඛා පදං සමාදියාමි'' යනුවෙනි.

21. බුදුන් වහන්සේ කිසිම අවස්ථාවක දී අටලෝ දහමින් උද්දාමයට හෝ කම්පාවට පත් නොවී සියල්ල මැදහත්ව විඳ දරා ගත්හ. උන්වහන්සේ තුළ පැවති එකී උත්තරීතර ගුණය හඳුන්වනු ලබන්නේ,

i. කරුණා ගුණය යනුවෙනි.
ii. මෙත්තා ගුණය යනුවෙනි.
iii. අරහං ගුණය යනුවෙනි.
iv. භගවා ගුණය යනුවෙනි.
v. තාදී ගුණය යනුවෙනි.

22. '' **මේ දහම් අකුසල්ය. මේ දහම් වරද සහිතය. මේ දහම් නුවණැත්තන් විසින් ගරහන ලද්දේය. මේ දහම් පිළිපැදීමෙන්, සමාදන් වීමෙන් අවැඩ පිණිස දුක් පිණිස පවතින්නේය යම් කලෙක තෙපි තුමූම දැන ගත්තාහු නම් එය දුරු කරමි."** යනුවෙන් දැක්වෙන බුද්ධානුශාසනාවෙන් අවධාරණය කෙරෙන්නේ,

i. බුදු දහම කාලාම සූත්‍රානුගත කුසල් පමණක් කිරීම අගය කළ බවයි.
ii. බුදු දහම නුවණැත්තන් විසින් ගරහන ලද දේ අගය කළ බවයි.
iii. බුදු දහම කිසිවකුට අවැඩ පිණිස දුක් පිණි සහේතු නොවන දේ කිරීම අගය කළ බවයි.
iv. බුදු දහම නිදහස් චින්තනය අගය කළ බවයි.
v. බුදු දහම අත්තනෝමතික පුද්ගල චින්තනය උසස් යැයි අගය කළ බවයි.

23. පිරිනිවන් පෑමට ආසන්නයේදී බුදුන් වහන්සේ භික්ෂූන් අමතා වදාළේ බුදුන්, දහම්, සඟුන් කෙරෙහි හෝ මාර්ගය කෙරෙහි හෝ නිවන පිළිබඳව හෝ යම් සැකයක් ඇත්නම් විමසා දැනගන්නා ලෙසයි. යමෙක් බුද්ධ ගෞරවය නිසා ප්‍රශ්න නොකරන්නේ නම් යහළුවකු මගින් හෝ කරුණු විමසා දැන ගන්නැයි අවවාද කළහ. මෙයින් ගම්‍ය වන්නේ බුදුරදුන් තුළ පැවති.

i. ධර්ම ප්‍රචාරයට තිබූ දැඩි කැමැත්තයි.
ii. ප්‍රශ්න විසඳීමට තිබූ අසමසම හැකියාවයි.
iii. තාදී ගුණයයි.
iv. විශිෂ්ට ශාස්තෘත්වයයි
v. මහා කාරුණික ගුණයයි.

24. සොහොනක අතරමං කොට දමා ගොස් තිබූ සෝපාකට බුදුන් වහන්සේ පිහිට වූ සේක. මින් ප්‍රකට වන්නේ, බුදුන් වහන්සේ තුළ පැවති,

i. අරහං ගුණයයි.
ii. පුරිස ධම්ම සාරථී ගුණයයි
iii. මහා කාරුණික ගුණයයි.
iv. සත්ථා දේවමනුස්සානං ගුණයයි.
v. මහා ප්‍රඥාවයි.

25. ''අණන '' සූත්‍රයේ විස්තර වන චතුර්විධ සුඛයන් අතර, ''භෝග සුඛ" යනුවෙන් අදහස් කෙරෙන්නේ,

i. තමා සතු සම්පත් නිසි පරිදි පරිභෝග කිරීමෙන් ලබන සතුටයි.
ii. භෝග වගා කිරීමෙන් ලබන සතුටයි.
iii. දැහැමිව භෝග සම්පත් උපයා ගැනීමෙන් ලබන සතුටයි.
iv. නිවැරදි දිවි පෙවතක් ගත කිරීමෙන් ලබන සතුටයි.
v. භව භෝග සම්පත් බහුලව රැස්කර ගැනීමෙන් ලබන සතුටයි.

26. බුදුරජාණන් වහන්සේ වනාහි උන්වහන්සේ විසින් දේශනා කරන ලද සියලු ම ගුණධර්මයන්ගේ ප්‍රතිමූර්තියයි. හතළිස් පස් වසරක කාලය තුළ දී තමන් විසින් ප්‍රකාශ කරන ලද වචන උන්වහන්සේ ක්‍රියාවට නැගූහ. කිසිදු දුබලතාවක් හෝ පහත් හැඟීමක් හෝ උන්වහන්සේගෙන් කිසිවිටෙකත් දෘශ්‍යමාන නොවීය. ලෝකයට ඉතාම පරිපූර්ණ ආචාරධර්ම පද්ධතියක් ඉදිරිපත් කරන ලද්දේ බුදුරජාණන් වහන්සේ විසිනි. " බුදුරජාණන් වහන්සේ පිළිබඳ නූතන ඇගයීමක් වන මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින්ද ?

i. මහාචාර්ය ලක්ෂ්මී නරසු
ii. ඇල්බට් අයින්ස්ටයින්
iii. මහාචාර්ය මැක්ස් මුලර්
iv. බර්ට්‍රන්ඩ් රසල්
v. එඩ්වින් ආර්නෝල්ඩ්

27. බුදුරජාණන් වහන්සේ වරක් චම්පා නුවරට වැඩම කළ පසු එගම නායක බමුණෙක් උන්වහන්සේ දැකීමට යාමට සූදානම් විය. ඔහුගේ සහචරයෝ ඒ ගමන වැළැක්වීමට විවිධ කතා කීහ. එහිදී බුදුරදුන්ගේ ගුණ කදම්බය වර්ණනා කළ නායක බමුණා සෙසු බමුණු පිරිස ද කැටිව බුදුරදුන් වෙත පැමිණියහ. එම බමුණා වූයේ.

i. සෝණදණ්ඩ ය.
ii. කසීභාරද්වාජ ය.
iii. සුන්දරික භාරද්වාජ ය.
iv. අකෝසකභාරද්වාජ ය.
v. අග්ගික භාරද්වාජ ය.

28. ස්වාමීනි, වඩිනු මැනවි. ඔබ වහන්සේගේ පැමිණීම ඉතා අගනේ ය. වැඩ හිඳිනු මැනවි. අසුන් පනවා තිබෙයැ " යි වච්ඡගොත්ත පරිබ්‍රාජකයා විසින් බුදුරදුන් පිළිගෙන තමා ද මිටි අසුනක හිඳගත් බව වච්ඡගොත්ත සූත්‍රයෙහි දක්වෙන සංසිද්ධියෙන් ප්‍රකට වන්නේ,

i. බුදුරජාණන් වහන්සේ තුළ පැවැති සමාජශීලි බවයි.
ii. බුදුරජාණන් වහන්සේ තුළ පැවැති සරල බවයි.
iii. බුදුරජාණන් වහන්සේ තුළ පැවැති ප්‍රියශීලි බවයි.
iv. බුදුරජාණන් වහන්සේ තුළ පැවැති ආගමික සහනශීලී බවයි.
v. වච්ඡගොත්ත පරිබ්‍රාජකයා බුදුරදුන්ගේ සමීපතම දායකයකු වූ බවයි.

29. බුද්ධ කාලීන බොහෝ රාජ්‍ය පාලකයින් බුදුරදුන් සමග සමීප ඇසුරක් පවත්වාගෙන යමින් ශාසන උන්නතිය සඳහා මහඟු මෙහෙවරක් ඉටුකර ඇත. ඇතැම් රාජ්‍ය පාලකයෝ මිත්‍රත්වය ඉක්මවා ගිය ඥාතීත්වයක් පවා ගොඩනගා ගැනීමට කැමැත්තක් දැක්වූහ. එසේ ඥාතිත්වයක් ගොඩනගා ගැනීමට යොමු වූ පාලකයෙකු ලෙස සැලකිය හැක්කේ,

i. කෝසලයේ පසේනදී කොසොල් රජතුමා ය.
ii. මගධාපති බිම්බිසාර රජතුමා ය.
iii. අවන්තියේ පාලකයා වූ චණ්ඩ පජෝත රජතුමා ය.
iv. ඡන්සයේ පාලකයා වූ උදේනි රජතුමා ය.
v. ගන්ධාරයේ පාලකයා වූ පුක්කුසාති රජතුමා ය.

30. ධර්ම සේනාධිපති සැරියුත් මහ රහතන් වහන්සේ විසින් දේශනා කළ සූත්‍ර ගණනාවක් සූත්‍ර පිටකය තුළ අන්තර්ගතව ඇත. එම සූත්‍ර අතර එක නම් කුමක්ද ? ආදී වශයෙන් පිළිවෙළින් දහය දක්වා සංඛ්‍යාත්මක දහම් කරුණු ඇතුළත් කොට දේශනා කළ විශේෂ සූත්‍රය හැඳින්වෙන්නේ නමිනි.

i. සංගීති සූත්‍රය
ii. ගුලිස්සානි සූත්‍රය
iii. සම්පසාදනීය සූත්‍රය
iv. සම්මා දිට්ඨි සූත්‍රය
v. ගෝසිංහ සූත්‍රය

31. බුදුරජාණන් වහන්සේ දේශනා කළ මහා නිදාන සූත්‍රය ශ්‍රවණය කිරීමෙන් අනතුරුව සෝවාන් ඵලයට පත් වූයේ,

i. ඛේමා තෙරණින් වහන්සේය
ii. නකුලමාතා උපාසිකාවය
iii. චිත්ත ගෘහපති උපාසකතුමාය
iv. මහාප්‍රජාපති තෙරණින් වහන්සේය.
v. විශාඛා මහෝපාසිකාවය

32. ''**අත්තාහි අත්තනෝ නාතෝ කෝහි නාතෝ පරෝසියා** '' යන බුදු වදන වඩාත් අර්ථවත් වන්නේ

i. බුදු දහමෙහි දැක්වෙන චින්තන හා විමංශන නිදහස සම්බන්ධයෙනි.
ii. බුදු දහමෙහි දැක්වෙන ආකාරවතී ශ්‍රද්ධාව සම්බන්ධයෙනි.
iii. බුදු දහමෙහි දැක්වෙන ආගමික සහනශීලිත්වය සම්බන්ධයෙනි;
iv. බුදු දහමෙහි දැක්වෙන හොඳ - නරක විනිශ්චය සම්බන්ධයෙනි.
v. බුදු දහමෙහි දැක්වෙන පුද්ගල ස්වාධීනත්වය හා ස්වච්ඡන්දතාව සම්බන්ධයෙනි.

33. අප විසින් සිදු කරනු ලබන හොඳ නරක ක්‍රියාවන් හැඳින්වීම සඳහා බුදුදහම විවිධ ව්‍යවහාර භාවිත කරයි. පින් - පව්, කුසල් - අකුසල්, සාවජ්ජ - අනවජ්ජ යනාදිය එයට නිදසුන් වේ. මේ අතරින් බහුලව භාවිත කර ඇත්තේ කුසල අකුසල, පුඤ්ඤ - පාප යන ව්‍යවහාරයන් ය. එම ඉගැන්වීම පිළිබඳ කියවෙන පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

i. "දස කුසල් මඟින් උගන්වන්නේ කළ යුතු ක්‍රියාවන්ය " යන්නයි.
ii. පින් නිවනට හේතු වේ. කුසල් සසරට හේතු වේ " යන්නයි.
iii. පාපය ද අකුසලය ද සමාන වන බවයි.
iv. දස පින් කිරියවත් මඟින් ත්‍රිශික්ෂාවට අදාළ ඉගැන්වීම් ඉදිරිපත් වන බවයි.
v. "කුසල් සිත් වැඩීම ආර්ය මාර්ගයට ඇතුළත් නොවේ " යන්නයි.

34. සතර බ්‍රහ්ම විහරණවල දැක්වෙන මෙත්තා යනු සියලු සත්වයන් කෙරෙහි සුබසෙත පැතීම වේ. කරුණාව යනු දුකට පත් සත්වයන් කෙරෙහි සානුකම්පිත ව කටයුතු කිරීමයි. එනම් මුදිතාව යනු,

i. නම්‍යශීලී ගුණයයි.
ii. අනුන්ගේ සැපතේ දී අවංකවම සතුටු වීමයි.
iii. අනුන්ගේ දුකේදී ඇතිවන කම්පනයයි.
iv. මෘදු මොළොක් ගතියයි.
v. ආත්මාර්ථයට වඩා පරාර්ථය ශ්‍රේෂ්ඨ කොට සැළකීමයි.

35. වර්තමානයේ ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන සෑම රාජ්‍යයකම කාන්තාවන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීමට අදාළ නීති රීති සම්පාදනය කොට කාන්තා අයිතින් වෙනුවෙන් ඒවා ක්‍රියාත්මක වීමක් ද සිදු වේ. බුදුරදුන් දැහැමි රාජ්‍ය පාලනය සඳහා ඉදිරිපත් කළ ඇතැම් ඉගැන්වීම්වල ද කාන්තා අයිතීන් සුරක්ෂිත කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. කාන්තා අයිතීන් සුරක්ෂිත කෙරෙන ඉගැන්වීම් ඇතුළත් රාජ්‍ය පාලන ධර්මය වන්නේ,

i. දස සක්විති වත් ය.
ii. දස රාජ ධර්මය.
iii. සතර අගතියෙන් තොරවීම ය.
iv. පඤ්ච සීල ප්‍රතිපදාව ය.
v. සප්ත අපරිහානීය ධර්ම ය.

36. ජාතක පාළියේ දැක්වෙන දසරාජ ධර්ම සර්ව කාලීන වටිනාකමකින් යුත් පාලන මූල ධර්මයක් ලෙස සැළකෙන අතර එහි පවත්නා එකිනෙක ධර්ම කරුණු විමසා බැලීමෙන් එය පැහැදිළි වේ. ඒ අනුව මහජනයා සමඟත් විදේශ රජුන් සමඟත් නොගැටී සහයෝගයෙන් ක්‍රියා කිරීම අයත් වන්නේ,

i. ඉවසීමට ය.
ii. ක්‍රෝධ නොකිරීමට ය.
iii. විරුද්ධ නොවීමට ය.
iv. ඍජුබවට ය.
v. අවිහිංසාවට ය.

37. දිළින්දන්ට ධනය නොලැබීම නිසා දිළිඳුකම වැඩිදියුණු වී එකිනෙක අසද් ධර්මයන් සමාජය තුළ හේතු ඵල න්‍යායට අනුරූපී ව ක්‍රමයෙන් වර්ධනය වන අයුරු චක්කවත්ති සීහනාද සූත්‍රයේ දක්වා ඇත. ප්‍රාණඝාතය හේතු කරගෙන ඊළඟට ඇතිවන අසද් ධර්මය ලෙස සූත්‍රයේ සඳහන් වන්නේ.

i. බොරුකීම.
ii. කේළාම් කීම.
iii. බදු මුදල් වැඩි කිරීම.
iv. අවි ආයුධ දරන ප්‍රමාණය වැඩිවීම.
v. පරහිංසාව,

38. අග්ඤ්ඤ සූත්‍රයේ දැක්වෙන පරිදි ආභස්සර බ්‍රහ්ම ලෝකයෙන් පැමිණ රස පොළව ආහාර ලෙස ගැනීමට පෙර සත්වයින් තුළ දක්නට ලැබුණ ලක්ෂණයන් අතුරෙන් එකක් වන්නේ,

i. ස්වයංජාත හැල් ආහාරයට ගැනීම
ii. ස්ත්‍රී පුරුෂ භේද සහිත වීම.
iii. ප්‍රීතිය ආහාරය කොට විසීම.
iv. මහත් වූ ශරීරයකින් යුක්ත වීම.
v. ශරීරය ක්‍රමයෙන් රළු වීම.

39. මූලික බෞද්ධ ඉගැන්වීම් පරීක්ෂා කර බලන විට එහි අසහාය දෙවි කෙනෙකුගේ පැවැත්ම හෝ විශ්වය කෙරෙහි අධිකාරීත්වය පැණවීම හෝ නොපිළිගන්නා බැව් තහවුරු වේ. බුදු දහම මානව කේන්ද්‍රීය ඉගැන්වීමක් ලෙස හැඳින්වීමට බොහෝ උගතුන් පෙළඹී ඇත්තේ එහි අන්තර්ගත,

i. නිර්මාණවාදී ලක්ෂණ නිසා ය.
ii. මානව ශක්‍යතාවයට ප්‍රමුඛස්ථානයක් ලබා දෙන නිසාය.
iii. භෞතික ලක්ෂණ නිසාය.
iv. අධිච්චසමුප්පන්නවාදී ලක්ෂණ නිසා ය.
v. කර්මයෙහි පවත්නා නියතිවාදී ස්වභාවය නිසාය.

40. පහත දැක්වෙන ප්‍රකාශ අතරින් හොඳ - නරක විනිශ්වයෙහිලා බෞද්ධ නිර්ණායකයක් ලෙස භාවිත කිරීමට වඩාත් සුදුසු වරණය තෝරන්න.

i. යම් ක්‍රියාවක් කොට පසුතැවීමට සිදුවේද, කඳුලු පිරි දෙනෙතින් විපාක විඳීමට සිදුවේ ද, එවැනි දෑ නොකටයුතුය.
ii. තථාගතවරු මග පෙන්වන්නෝ වෙති. විමුක්තිය සාක්ෂාත් කිරීම ඔබගේ කටයුත්තකි.
iii. තථාගත ධර්මය විවෘත වූ තරමට බැබළේ. වසා තැබීමෙන් නොබැබළේ.
iv. කයෙන්, වචනයෙන්, මනසින් සංවරවීම මැනවි.
v. තමාට කණ දිනයක් කොට, පහසක් කෙකොට, සරණ කොට වසය කරන්න.

41. "පිඟානට බෙදා ගත් ආහාරයෙන් පවා කොටසක් දත් දී තිරිසන් සතෙකුගේ හෝ කුසගිනි නිවීමට උනන්දු වූ විදානෙ මාමා සියලු දෙනාට දයාබර වදනින් ඇමතීමටත්, අවම වශයෙන් ප්‍රියමනාප සිනහවකින් හෝ සංග්‍රහ කිරීමටත් පුරුදුව සිටියේය. නීති පන්සිල් ද පොහෝදින අටසිල් ද හොඳින් සුරැකි ඔහු, තමා හොඳින්ම දන්නා බණපොතක් වුව ද ශබ්ද නගා කියවූයේ ශ්‍රාවක උවසු උවැසියන්ගේ යහපත උදෙසාමය. ලොකු කුඩා, බාල මහලු, දුප්පත් පොහොසත් භේදයකින් තොරව සියලු දෙනා වෙත සම සිතින් යුතුකම් ඉටුකළ විදානේ මාමා සරල වූත්, සුන්දර වුන්, තෘප්තිමත් ජීවිතයක් ගත කළේය."

ඉහත ඡේදයේ සමස්ත අර්ථයට අනුව වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ, විදානෙ මාමා

i. හොඳින් දන්දුන් බවයි.
ii. ප්‍රිය වදනින් අන් අය ඇමතූ බවයි.
iii. අන් අයගේ යහපත උදෙසාම කැප වූ බවයි.
iv. සතර සංග්‍රහ වස්තු හොඳින් ප්‍රගුණ කළ බවයි.
v. උස් පහත් භේද නොසලකා කටයුතු කළ බවයි.

42. පහත සඳහන් ප්‍රකාශ අතරින් බෞද්ධ ඉගැන්වීමට අනුව සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

i. නීති ගරුකත්වය අපරිහානීය ධර්මයක් ලෙස බුදු සමයේ දැක්වේ.
ii. සාමූහික පැවැත්ම උදෙසා නීති ගරුකත්වයේ අවශ්‍යතාව ශික්ෂාපද පැනවීමේ පරමාර්ථ වලින් පැහැදිලි වේ.
iii. අපරාධ වැළැක්වීමේ එකම පිළියම දඬුවම ලෙස බුදු සමය නොපිළිගනී.
iv. අපරාධ වලට හේතු සෙවීමට කාලය මිඩංගු නොකොට ඒවා මර්දනය කළ යුතුය.
v. සමාජ සම්මතයක් වූ නීතිය නො ඉක්මවා ක්‍රියා කළ යුතුය.

43. පහත දැක්වෙන වරණ අතරින් දස කුසල් වලට ඇතුළත් වනුයේ,

i. බණ කීම හා බණ ඇසීමයි.
ii. දානය හා ශීලයයි.
iii. පිං දීම හා පිං අනුමෝදන් වීමයි.
iv. වතාවත් කිරීම හා ගරු බුහුමන් කිරීමයි.
v. බොරු නොකීම හා කේලාම් නොකීමයි.

44. ධන සම්පත් කළමනාකරණය පැහැදිලි කෙරෙන බෞද්ධ සිද්ධාන්තයක් ලෙස හඳුනා ගැනීමට වඩාත් යෝග්‍ය වන්නේ ............................................පිළිබඳ ඉගැන්වීමයි.

i. පංචබලී
ii. සමජීවිකතාව
iii. අපාය මුඛ
iv. භෝග සුඛ
v. සම්මා ආජීවය

45. බෞද්ධ ඉගැන්වීම් අනුව පුද්ගලයාගේ ආර්මික සමෘද්ධියෙහිලා ශ්‍රමයේ ඇති වැදගත්කම පැහැදිලි කරන ඉගැන්වීමක් ලෙස සැලකිය හැක්කේ ........................ යන්නයි.

i. "අචරිත්වා බ්‍රහ්මචරියං අලද්ධා යොබ්බනේ ධනං "
ii. "උට්ඨානවතො සතිමතෝ සුචිකම්මස්ස නිසම්මකාරිනෝ "
iii. ''බාහාබල පරිචිතේහි සේදා වක්ඛිත්තේහි ධම්මිකේහි ධම්ම ලද්දෙහි භෝගේහි "
iv. "න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධිමත්තනො "
v. "අනවජ්ජානි කම්මානි "

46. බුදුරජාණන් වහන්සේ විසින් නිර්මාණාත්මක සෞන්දර්යය අගය කරන ලද අවස්ථාවක් නිරූපණය වන සූත්‍රයක් වන්නේ,

i. ආටානාටිය සූත්‍රයයි.
ii. සක්කපඤ්හ සූත්‍රයයි.
iii. ධනිය සූත්‍රයයි.
iv. අරිය පරියේසන සූත්‍රයයි.
v. මහාපරිනිබ්බාන සූත්‍රයයි.

47. පහත දැක්වෙන්නේ බෞද්ධ ඉගැන්වීම් වල එන ප්‍රසිද්ධ ප්‍රකාශ කිහිපයකි.

A. රාග - ද්වේග - මෝහ සහගත ක්‍රියා අසාධු පාප ක්‍රියා ලෙස කාලාම සූත්‍රය පැහැදිලි කරයි.

B. අත්තූපනායික ධර්ම පර්යායට අනුව හොඳ නරක නිශ්චය කළ හැකි ය.

C. කැඩපතකින් තමාම තම සිරුර නිරීක්ෂණය කරන්නා සේ තම කායික, වාචසික හා මානසික ක්‍රියා ප්‍රත්‍යවේක්ෂා කළ යුතු ය.

D. යම් ක්‍රියාවක් කොට පසුතැවිල්ලට පත්වේ ද කඳුළු පිරි දෙනෙතින් විපාක විඳීමට සිදුවේද එවැනි පාප ක්‍රියා නොකළ යුතු ය.

E. නිරෝගී සුවය පරම ලාභය ද සතුට පරම ධනය ද විශ්වාසවන්තයා පරම නෑයා ද වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් හොඳ නරක විනිශ්චයෙහිලා භාවිත කළ හැකි නිර්ණායක ලෙස සැලකිය හැක්කේ,

i. A සහ B පමණි.
ii. A සහ C පමණි.
iii. A සහ D පමණි.
iv. A, B, C සහ D පමණි.
v. A, B, C, D සහ E යන සියල්ල ම ය.

48. පංචසීල ප්‍රතිපදාවට අනුව පුද්ගලයාගේ ජීවත් වීමේ අයිතිය හා දැහැමිව උපයන ලද සම්පත් තමන් සතුව තබා ගැනීමේ අයිතිය තහවුරු කරන ශික්ෂා පද දෙක වන්නේ,

i. ප්‍රාණ ඝාතයෙන් හා කාම මිථ්‍යාචාරයෙන් වැළකීමයි.
ii. ප්‍රාණ ඝාතයෙන් හා අදත්තාදානයෙන් වැළකීමයි.
iii. ප්‍රාණ ඝාතයෙන් හා මුසාවාදයෙන් වැළකීමයි.
iv. ප්‍රාණ ඝාතයෙන් හා සුරාවෙන් වැළකීමයි.
v. අදත්තාදානයෙන් හා කාම මිථ්‍යාචාරයෙන් වැළකීමයි.

49. සෞන්දර්ය රසාස්වාදය බුදුසමයට අනුචිත නොවූවකි. බුදුරජාණන් වහන්සේ මෙන්ම වීතරාගී උතුමන් ද නිරාමිස සෞන්දර්ය රසාස්වාදය කළ බව බෞද්ධ මූලාශ්‍රයවල දක්නට ලැබේ. බෞද්ධ විග්‍රහයට අනුව සෞන්දර්ය රසාස්වාදයේ පදනම ලෙස හඳුනාගත හැක්කේ,

i. සුඛාස්වාද යයි.
ii. කර්මඵල විශ්වාසයයි.
iii. ශ්‍රද්ධාව ජනිත කරවීමයි.
iv. ත්‍රිලක්ෂණය මෙනෙහි කිරීමයි.
v. ප්‍රසාදය සහ නිර්වේදයයි.

50. ශ්‍රමය හා ධනය අතර සම්බන්ධය වඩාත් පැහැදිලිව අවධාරණය කොට ඇති සූත්‍රයක් වන්නේ,

i. සිඟාලෝවාද සූත්‍රයයි.
ii. මංගල සූත්‍රයයි.
iii. අනණ සූත්‍රයයි.
iv. ඉණ සූත්‍රයයි.
v. පත්තකම්ම සූත්‍රයයි.